වාර්ෂික වාර්තාව - 2019

ஆண்டறிக்கை - 2019

Annual Report - 2019

හෝමියෝපති වෛද්‍ය සභාව
ஹோமியோபதி மருத்துவ சபை
Homoeopathic Medical Council

අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර.
දුරකථන අංක : 011-2958175 ෆැක්ස්: 011-2958175
E mail : homosri.mcouncil@gmail.com.

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

சுகாதார, போசணை மற்றும் சுதேச வைத்திய அமைச்சு

Ministry of Health, Nutrition & Indigenous Medicine



වාර්ෂික වාර්තාව

2019

හෝමියෝපති වෛද්‍ය සභාව

සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය

පටුන

පිටුව

1. සාරාංශය 02

2. හැඳින්වීම 03

3. හෝමියෝපති වෛද්‍ය සභාව 04

4. පසුබිම් විස්තරය 05

5. වෛද්‍ය සභාවේ අරමුණු 07

6. වෛද්‍ය සභාව සතු බලතල 08

7. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය සහ ධුර කාලය 10

8. සංස්ථාපිත තොරතුරු 11

9. හෝමියෝපති වෛද්‍ය සභාවේ කාර්ය සාධනය 12

10. වාර්ෂික ගිණුම් වාර්තා 21

11. විගණන වාර්තාව

12. සුභාසිංශන

01. සාරාංශය

2019 වසර තුළ හෝමියෝපති වෛද්‍ය සභාවේ සමස්ත ක්‍රියාකාරීත්වයට අදාළව සකස් කෙරෙන වාර්ෂික වාර්තාව මෙසේ ඉදිරිපත් කෙරේ. වෛද්‍ය සභාවේ දැක්ම හා අරමුණුවලට අදාළව එහි ක්‍රියාකාරීත්වය ඇගයීමට මෙමඟින් අවස්ථාව සැලසෙනු ඇත.

2019 සමස්ත වර්ෂයම ගෙවී ගියේ හෝමියෝපති වෛද්‍ය සභාවේ අධ්‍යක්ෂ මණ්ඩලය පත් නොකෙරුණු සහ ඒ නිසාම එහි මෙහෙයුමට යටත්ව සභාවේ කාර්යයන් ක්‍රියාත්මක නොවූ වසරක් ලෙසය.

2016 අංක 10 දරණ හෝමියෝපති පනත අනුව පත් කෙරුණු ප්‍රථම හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය 2018 ඔක්තෝබර් 19 දිනෙන් අවසන් විය. එහෙත් වෛද්‍ය සභාවට එරෙහිව ගොනු කර තිබුණු CA/87/2013 අංක දරණ නඩු තීන්දුව මඟින් වර්ධනය කෙරී තිබුණු ආයතනික ගැටලුව මත වෛද්‍ය සභාවක් යළි පත් කිරීමේ නීතිමය අර්බුදයක් මතුව තිබුණි. එබැවින් එම නඩු තීන්දුවට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ අමාත්‍යාංශය විසින් ගොනු කර තිබූ අභියාචනයේ තීරණය අපේක්ෂාවෙන් ගෙවුණු වසරක් ලෙස ද මෙම වසර හැඳින්විය හැකිය. මේ නිසා වෛද්‍ය සභාවේ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සිදු කෙරුණු අතර ඒවා ක්‍රියාවට නැඟුනේ වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරීවරයා මඟිනි.

2019 වසර හෝමියෝපති වෛද්‍ය සභා ඉතිහාසයේ ඉතා වැදගත්ම පිය සටහන් තැබූ වසරක් විය. එනම් මෙතෙක් දිස්ත්‍රික්ක 07ක පවත්වාගෙන යනු ලැබූ රජයේ හෝමියෝපති සායන 07 ට අතිරේකව තවත් දිස්ත්‍රික්ක පහක් තුළට ව්‍යාප්ත කරමින් රජයේ සායන 12 දක්වා වර්ධනය කිරීමට මෙම වසර තුළ හැකියාව ලබා ගන්නා ලදී. මෙමඟින් හෝමියෝපති ප්‍රතිකාර සඳහා රටේ දුර බැහැරින් ඇදී ආ ජනතාවට සැලකිය යුතු පහසුවක් ඇති කිරීමට හැකි වූ අතර එමඟින් හෝමියෝපති ප්‍රතිකාර සේවාව රට තුළ නව ජවයකින් ව්‍යාප්ත කිරීමට හැකියාව ලැබුණි. එහි අනෙක් වැදගත්ම ප්‍රතිඵලය වුයේ වෛද්‍ය වෘත්තිකයන් 07 දෙනෙක් රජයේ හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් ලෙස සේවයට බඳවා ගැනීමට අවස්ථාව සැලසීමය. එමෙන්ම නව කම්කරු තනතුරු 5ක් සඳහා මෙම වසර තුළ බඳවා ගැනීමට හැකියාව ලැබුණි.

02. හැඳින්වීම

“ සමාන දෙයින් සමාන දෙය සුවපත් කිරීම ” යන ස්වාභාවික මූලධර්මය මත පදනම් වූ වෛද්‍ය ක්‍රමයක් ලෙස හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්විය හැකිය. 18 වන සියවසේ දී මෙම වෛද්‍ය ක්‍රමය ලොවට හඳුන්වා දෙනු ලැබුවේ බටහිර වෛද්‍ය ක්‍රමයේ විශේෂඥයෙකු වූ ජර්මන් ජාතික ක්‍රිස්ටියන් ෆෙඩ්රික් හානිමාන් විසිනි. අද වන විට විද්‍යාත්මකව හා තාක්ෂණිකව වර්ධනය වෙමින් පවතින හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාව තුළ ප්‍රබල ස්ථානයකට පත් කිරීමට කටයුතු සිදුකරමින් පවතී. මේ වන විට ලොව පුරා හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවයට අනුයුක්ත කර, ලොව පුරා විහිදුණු හෝමියෝපති රෝහල් පද්ධතියක් මඟින් මහජන සෞඛ්‍ය සේවා පැවැත්වීමට පමණක් සීමා නොවී, හෝමියෝපති වෛද්‍ය උපාධි ප්‍රදානය කරන විශ්ව විද්‍යාල, හෝමියෝපති ඖෂධ නිෂ්පාදන කරන කර්මාන්ත ශාලා සහ හෝමියෝපති පර්යේෂණ ආයතන ද බිහි කරමින් පවතින බව සඳහන් කල යුතුය.

1970 අංක 07 දරණ හෝමියෝපති පනත මඟින් මුලින්ම ශ්‍රී ලංකා හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපනය කළ අතර එය හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත කිරීමේ සහ වර්ධනය කිරීමේ භාර ධුර කාර්යයට උර දී ඇත. එහෙත් එහිදී පැන නැගි නීතිමය හා ව්‍යුහාත්මක බාධාවන් ඉදිරියේ අවසාන වශයෙන් වෛද්‍ය සභාව බිඳ වැටුණි. කෙසේ වෙතත් මෙම අභියෝගයන් ජය ගැනීමේ අරමුණ ද සහිතව 2016 අංක 10 දරණ හෝමියෝපති පනත පාර්ලිමේන්තුව විසින් සම්මත කෙරුණි. මෙම නව පනතේ I කොටසේ 2 වගන්තිය ප්‍රකාරව හෝමියෝපති වෛද්‍ය සභාව යළි පිහිටුවීම සඳහා වන කර්තව්‍යයන් ඉටු කිරීම පිණිස, පනතේ 51 වගන්තිය අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ මුල් ස්වරූපය ලෙස ගැනිය හැකි හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් 2016 වසරේ දී ස්ථාපිත කරන ලදී. ගරු අමාත්‍යතුමා විසින් පත් කරන ලද, හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව හෝමියෝපති වෛද්‍යවරුන් 04 දෙනෙකුගෙන් සහ රාජ්‍ය නිලධාරීන් 6 දෙනෙකුගෙන් සමන්විත විය. හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී මෙම සභාවේ ලේකම්වරයා වේ.

හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු සාධනයෙහි ලා එහි කාර්ය භාරය යටතට ගැනෙන හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් දිස්ත්‍රික් 07 ක රජයේ හෝමියෝපති සායන 07 ක් ස්ථාපිත කර තිබුණි. දෙහිවල, පරකඩුව, මොණරාගල, පාලමුනෙ, මාතලේ, කුරුණෑගල, හා තෝලංගමුව මෙසේ වෛද්‍ය සභාව මඟින් රජයේ හෝමියෝපති සායන පවත්වාගෙන යනු ලැබූ ස්ථාන විය.

2019 වසරේදී වෛද්‍ය සභාව විසින් මෙහෙයවන රජයේ හෝමියෝපති සායන තවත් දිස්ත්‍රික්ක 05ක එක් දිස්ත්‍රික්කයකට එක බැගින් ස්ථාපිත කිරීමට හැකිවීම ඉමහත් ජයග්‍රහණයක් විය. ඒ අනුව මෙතෙක් 07ක්ව පැවති රජයේ හෝමියෝපති සායන සංඛ්‍යාව 12ක් දක්වා වර්ධනය කිරීමට හැකි විය. ඒ අනුව කාර්ය මණ්ඩලයටද නව තනතුරු 10කට බඳවා ගැනීමට හැකි විය.

03. හෝමියෝපති වෛද්‍ය සභාව

දැක්ම

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජාතික සෞඛ්‍ය සේවාවක් දක්වා ප්‍රවර්ධනය කිරීම”

මෙහෙවර

“හෝමියෝපති වෛද්‍ය ක්‍රමය අරභයා මානව හා භෞතික සම්පත් වර්ධනය කිරීම සම්බන්ධ නිසි ප්‍රතිපත්ති සම්පාදනය කරමින්, එය පොදු ජනතාව අතර ප්‍රචලිත කිරීම, නගා සිටුවීම හා අභිවර්ධනය කිරීම.”

පරමාර්ථ

2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ විධි විධානවලට අනුකූලව හෝමියෝපති ක්ෂේත්‍රයේ වෘත්තීය අධ්‍යාපන හා සෞඛ්‍ය සේවාව ගුණාත්මකව සංවර්ධනය කිරීම හා දැනුම, කුසලතා හා පළපුරුද්ද සහිත වෘත්තිකයන් මඟින් රෝගීන්ගේ නිරෝගීභාවය ප්‍රතිස්ථාපනය කිරීම හා නිරෝගී පුද්ගලයන්ගේ නිරෝගීභාවය සංරක්ෂණය කිරීම සඳහා වෘත්තීමය නෛතික අධිකාරීත්වය පිරිනැමීම මඟින් වෘත්තීය ගෞරවය හා ගුණාත්මකභාවය සුරක්ෂිත කිරීම.

04. පසුබිම

හෝමියෝපති වෛද්‍ය සභාව ව්‍යවස්ථාපිත ආයතනයකි. ප්‍රථම වෛද්‍ය සභාව **හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව** ලෙස 2016 අංක 10 දරණ හෝමියෝපති පනත මඟින් පත් කෙරෙන අතර එහි සාමාජිකයන් පත් කිරීමේ බලය ගරු අමාත්‍යතුමා වෙත පැවරී ඇත. තදනන්තර වෛද්‍ය සභාවන් නිල බලයෙන් පත් කෙරෙන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතර ජන්දයෙන් තෝරා ගැනෙන සාමාජිකයින් පස් දෙනෙකු, හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු අනිවාර්යයෙන් ඇතුළත් වන සේ ගරු අමාත්‍යතුමා විසින් පත් කෙරෙන තිදෙනෙකු ඇතුළත් 11 දෙනෙකුගෙන් සැදුම්ලත් මණ්ඩලයකින් සමන්විත වේ. පනතේ ප්‍රතිපත්ති හා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා වන නියෝග සෑදීමේ බලය ගරු අමාත්‍යතුමා සතු වන අතර නියම කර ඇති ක්ෂේත්‍ර සම්බන්ධයෙන් පනතට අනුකූලව රීති සම්පාදනය කිරීමේ බලය සභාව වෙත පවරනු ලැබ ඇත.

නීති සහ රෙගුලාසි

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත ක්‍රියාත්මකවීම ආරම්භ වන දිනයේදී බලාත්මකව පැවති සෑම නියෝගයක්ම, මෙම පනත යටතේ නියෝග සාදන තෙක්, මෙම පනත ප්‍රකාරව සාදන ලද නියෝග ලෙස පනතට අනුකූලව සැලකේ. නව පනත යටතේ අවශ්‍ය නියෝග සම්පාදනය සඳහා අවශ්‍ය කටයුතු මේ වන විට සිදුකරමින් පවතින හෙයින් 1970 අංක 07 දරණ හෝමියෝපති පනත යටතේ බලාත්මකව පැවති නියෝග මේ අනුව තවදුරටත් වලංගුව පවතී.

1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුව ප්‍රකාශයට පත් කර ඇති නියෝග

1. හෝමියෝපති රෙගුලාසි - 1980

   (වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීමේ

   රෙගුලාසි සහ හෝමියෝපති ඖෂධ ආනයනය)

2. හෝමියෝපති වෛද්‍ය සභාවේ නීති - 1981

3. හෝමියෝපති වෛද්‍ය සභා මැතිවරණ රෙගුලාසි - 1998

හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කිරීම.

මෙරට මුලින්ම හෝමියෝපති වෛද්‍ය සභාවක් පත්කර ඇත්තේ, 1970 අංක 07 දරණ හෝමියෝපති පනතට අනුකූලව, 1979 වසරේ දී විෂය භාර ගරු අමාත්‍යතුමා විසිනි. එම පනතට අනුව වසර 5 කට වරක් වෛද්‍ය වෘත්තිකයන්ගේ ඡන්දයෙන් වෛද්‍ය සභාව පත් කර ගත යුතු (පළමු වෛද්‍ය සභාව හැර) වුවද අඛණ්ඩව වෛද්‍ය සභාව පත් කර ගනු ලැබීමක් සිදුව නොතිබුණි. 1979 ට පසුව දෙවැනි වෛද්‍ය සභාව 1998 දීත්, තෙවැන්න 2006 දීත් වශයෙන් පත්ව ඇති අතර තුන්වෙනුව පත් කෙරුණ වෛද්‍ය සභාව 2009 දී නිල කාලය නිමවීමට පෙර විෂයභාර අමාත්‍යතුමා විසින් විසුරුවා හැර ඉතිරි වසර දෙකක කාලය සඳහා නව වෛද්‍ය සභාවක් පත් කරන ලදී.

එහි නිල කාලය 2011 ජනවාරි 30 දිනෙන් අවසන් විය. ඒ වන විට බල පැවති හෝමියෝපති පනතේ දුර්වලතා මගහැර නව පනතක් ගෙන එන තෙක් වෛද්‍ය සභාවේ කටයුතු පවත්වාගෙන යාම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතියක් මත ගරු අමාත්‍යතුමා හෝ අමාත්‍යාංශ ලේකම්වරයා හෝ මඟින් හෝමියෝපති අතුරු පාලක කමිටු පත් කෙරුණි. 2011 ජුනි 16 වැනි දින සිට 2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත හඳුන්වා දුන් 2016 ජූලි 29 තෙක්ම හෝමියෝපති වෛද්‍ය සභාවේ කටයුතු මෙහෙයවනු ලැබුවේ අතුරු පාලක කමිටුවක් මඟිනි. මෙසේ පත් කෙරුණු අතුරු පාලක කමිටු සංඛ්‍යාව 05කි. මෙම කාල වකවානුව පුරාම හෝමියෝපති වෛද්‍යවරුන්ගේ තාක්ෂණික කමිටුවක සහාය හෝමියෝපති අතුරු පාලක කමිටුවට ලැබුණි.

හෝමියෝපති අතුරු වෛද්‍ය සභාව

2016 අංක 10 දරණ නව හෝමියෝපති පනත සම්මත වීමෙන් පසුව 2016 ඔක්තෝබර් මස 21 දින සෞඛ්‍ය, පෝෂණ හා දේශීය වෛද්‍ය ගරු අමාත්‍යතුමා විසින් පනත මඟින් ඔහු වෙත ලබා දී ඇති බලතල වලට අනුකූලව හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවක් පත් කරන ලදී. පනතට අනුව මුලින්ම පත් කෙරෙනුයේ හෝමියෝපති අතුරු වෛද්‍ය සභාවය. එහි නිල කාලය වසර දෙකකි. පනත බලාත්මක කිරීමට අත්‍යාවශ්‍ය වන නියෝග සම්පාදනයට අදාළ මූලික කෙටුම්පත් සකසා සම්මත කරවා ගැනීම මෙම සභාවේ ප්‍රමුඛ කාර්ය ලෙස සැලකුණි. ඒ අනුව පනත සඳහා වන රෙගුලාසි, වෛද්‍යවරුන් ලියාපදිංචිය සඳහා වන රෙගුලාසි, හෝමියෝපති ඖෂධ ආනයනය, බෙදාහැරීම, නිෂ්පාදනය සඳහා වන රෙගුලාසි, හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ස්ථාපිත කිරීම සඳහා වන රෙගුලාසි, සහ පනතේ 30 වගන්තිය අනුව පැවැත්විය යුතු විභාගය සඳහා වන රෙගුලාසි සඳහා වන කෙටුම්පත් සකස් කර සභාවේ සම්මත කර ගෙන අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මීට අමතරව මෙම වෛද්‍ය සභාවේ සභාපතිවරයා වූ වෛද්‍ය චන්දන වීරසේකර මහතා විසින් හෝමියෝපති දෙපාර්තමේන්තුවක් සඳහා වන කෙටුම්පතක් සකස් කර අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කරන ලදී. මෙම අතුරු වෛද්‍ය සභාවේ නිල කාලය මෙම වසරේ ඔක්තෝබර් 19 දිනෙන් අවසන් විය.

05. වෛද්‍ය සභාවේ අරමුණු

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව හෝමියෝපති වෛද්‍ය සභාවේ අරමුණු පහත සඳහන් පරිදි

1) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම සහ නියාමනය කිරීම.
2) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව මහජන සෞඛ්‍ය වර්ධනය කිරීමේ අරමුණ ඇතිව සමාජය තුළ හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම.
3) හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ අධ්‍යයනය කිරීම, පර්යේෂණ කිරීම සහ හෝමියෝපති වෛද්‍ය වෘත්තියේ යෙදීම ප්‍රවර්ධනය කිරීම සහ උනන්දු කරවීම.
4) හෝමියෝපති ආයතනයන් පිහිටුවා පවත්වා ගෙන යාම.
5) රජයේ හෝමියෝපති රෝහල හැර හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුව ප්‍රතිකාර ලබාදෙන හෝමියෝපති ආයතන නියාමනය කිරීම සහ පාලනය කිරීම.
6) හෝමියෝපති බෙහෙත් වර්ග, ඖෂධ සහ වෙනත් පිළියෙල කිරීම්, නිෂ්පාදන, ආනයනය, ගබඩා කිරීම, විකිණීම සහ බෙදා හැරීම නියාමනය කිරීම සහ පාලනය කිරීම.

06. වෛද්‍ය සභාවේ බලතල

පනතේ 16 වැනි වගන්තිය ප්‍රකාරව පහත සඳහන් බලතල හෝමියෝපති වෛද්‍ය සභාව සතුවේ.

01) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන්, හෝමියෝපති ඖෂධවේදීන්, හෝමියෝපති හෙදියන්, සහ හෝමියෝපති ආයතන ලියාපදිංචි කිරීම.

02) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලබා ඇති අධ්‍යාපන සුදුසුකම් පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම.

03) හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් වෙත සුදුසුකම් ප්‍රදානය කළ ආයතන වෙතින් ඒ පිළිබඳ සහතික කරවා ගැනීම.

04) හෝමියෝපති වෛද්‍ය විද්‍යාල හෝ ආයතන නියාමනය කිරීම සඳහා පරීක්ෂකවරුන් පත් කිරීම.

05) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව ප්‍රතිකාර සේවා සැපයීම.

06) හෝමියෝපති ආයතන පිහිටුවීම, පවත්වා ගෙන යාම සහ පශ්චාත් අධ්‍යයන පාඨමාලා සකස් කිරීම.

07) හෝමියෝපති ඖෂධ ආනයනය හෝ අපනයනය.

08) හෝමියෝපති ඖෂධ විද්‍යාත්මකව නිෂ්පාදනය කිරීම හා දිරිමත් කිරීම.

09) හෝමියෝපති වෛද්‍ය පහසුකම්, උපකරණ, පාඨමාලා හා විභාග සම්බන්ධ අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

10) හෝමියෝපති විෂය හදාරන්නන්ට ශිෂ්‍යත්ව සහ වෙනත් පහසුකම් ප්‍රදානය කිරීම, හෝමියෝපති පර්යේෂණ ආයතන දිරිමත් කිරීම, අවශ්‍ය ආයතන සහ පුද්ගලයින් සඳහා මූල්‍යාධාර හෝ වෙනත් සහන ලබාදීම.

11) පශ්චාත් උපාධි හෝමියෝපති වෛද්‍ය අධ්‍යාපනය සම්බන්ධ වෛද්‍ය අධ්‍යාපන අවම ප්‍රමිති නියම කිරීම හා පවත්වා ගෙන යාම.

12) හෝමියෝපති වෛද්‍ය ක්‍රමයට අනුකූලව මහජන සෞඛ්‍ය සේවාව වැඩිදියුණු කිරීම.

13) වෛද්‍ය විද්‍යාවට සම්බන්ධ උපාධි හා අනෙකුත් අධ්‍යාපන විශිෂ්ටතා ප්‍රදානය කිරීම සඳහා උසස් අධ්‍යාපන ආයතන සමඟ කටයුතු කිරීම.

14) 1978 අංක 16 දරණ විශ්ව විද්‍යාල පනතට අනුකූලව හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් පිහිටුවීම සම්බන්ධයෙන් කටයුතු කිරීම.

15) සභාවේ කාර්යය සහ කර්තව්‍ය ඉටු කිරීම සඳහා අවශ්‍ය විය හැකි මණ්ඩල හා කමිටු අමාත්‍යවරයාගේ අනුමැතිය ඇතිව පිහිටුවීම.

16) නිලධරයෙකු හෝ කමිටුවක් වෙත යම් බලතල හෝ කාර්යයන් පැවරීම.

17) සභාවේ බලතල, කාර්යය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම සඳහා රීති සෑදීම.

18) පනත යටතේ බලතල හා කාර්යය ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම.

07. වෛද්‍ය සභාවේ සාමාජිකත්වය හා ධුර කාලය

2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුව වෛද්‍ය සභාවේ සාමාජික සංඛ්‍යාව සභාපති ද ඇතුළුව 11 කි. නිල බලයෙන් පත් වන රේඛීය අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු, භාණ්ඩාගාරයේ නියෝජිතයෙකු, සහ විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නියෝජිතයෙකු ගෙන් සමන්විත රාජ්‍ය නිලධාරීන් තිදෙනෙකු, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් අතරින් ජන්දයෙන් තෝරා ගැනෙන පස් දෙනෙකු සහ හෝමියෝපති වෛද්‍යවරුන් දෙදෙනෙකු ද අනිවාර්යෙන් ඇතුළත් වන පරිදි ගරු අමාත්‍යතුමා විසින් පත් කරනු ලබන තිදෙනෙකු සහිතව සාමාජිකයින් 11 දෙනා පත් කෙරේ. වෛද්‍ය සභාවේ ලේකම්/ලේඛකාධිකාරී ගරු අමාත්‍යතුමාගේ අනුමැතිය මත පත් කරනු ලබන්නේ සභාව විසිනි. සභාව වසර තුනක් සඳහා පත් කෙරෙන අතර ලේකම්/ලේඛකාධිකාරී වසර 5 ක් සඳහා පත් කෙරේ.

08. සංස්ථාපිත තොරතුරු

ආයතනයේ නම	:-	හෝමියෝපති වෛද්‍ය සභාව
ලිපිනය	:-	අංක 94, ෂෙල්ටන් ජයසිංහ මාවත, වැලිසර, රාගම.
දුරකතන අංකය	:-	011-2958175
ෆැක්ස්	:-	011-2958175
විද්‍යුත් තැපෑල		homosri.mcouncil@gmail.com
සංස්ථාපිත ආයතනයේ තත්ත්වය	:-	2016 අංක 10 දරණ හෝමියෝපති පනතේ 15,16 හා 17 වගන්ති ප්‍රකාර අරමුණු හා බලතල මත හෝමියෝපති වෛද්‍ය සභාව ස්ථාපිත කර ඇත.
පරිපාලන ව්‍යුහය	:-	ලේකම් / ලේඛකාධිකාරී කාර්යභාර වෛද්‍යවරු කළමනාකරණ සහකාර ඖෂධ සංයෝජක කාර්යාල සහායක
බැංකුකරුවෝ	:-	ලංකා බැංකුව - තැප්‍රොබේන් ශාඛාව, කොළඹ කොමර්ෂල් බැංකුව - ජා ඇල

09. හෝමියෝපති වෛද්‍ය සභාව කාර්ය සාධනය

2016 අංක 10 දරණ හෝමියෝපති පනත යටතේ පත් කරනු ලැබූ පළමුවන වෛද්‍ය සභාවේ නිල කාලය අවසන් වීමෙන් පසුව දෙවන හෝමියෝපති වෛද්‍ය සභාව පත්කර ගත යුතුව තිබුණු නමුත්, 2018 දෙසැම්බර් 31 දක්වාම එම කාර්යය ඉටුකර ගැනීමට නොහැකි විය. හෝමියෝපති වෛද්‍ය සභාව පත් කර ගැනීම සඳහා වන නිලවරණය මෙම වසරේ දී රේඛීය අමාත්‍යාංශය විසින් පවත්වනු ලැබුව ද ගරු අභියාචනාධිකරණ CA/87/2013 අංක දරණ නඩු තීන්දුව මඟින් පෙර පැවති හෝමියෝපති අතුරු පාලක කමිටුව පත් කිරීම හා එහි තීරණ අවලංගු කරමින් දෙනු ලැබූ නඩු තීන්දුව නිසා වෛද්‍ය සභාව යළි පත් කිරීම සිදු නොවීමට ප්‍රධාන වශයෙන්ම හේතු විය.

මෙම තත්ත්වය යටතේ හෝමියෝපති වෛද්‍ය සභාව ප්‍රායෝගිකව බලාත්මකව නොපැවති වසරක් ලෙස මෙම වසර සැලකිය හැකිය. මේ අනුව වෛද්‍ය සභාවේ කාර්යයන් පවත්වා ගෙනයනු ලැබුවේ සෞඛ්‍ය සහ දේශීය වෛද්‍ය සේවා අමාත්‍යාංශයේ දේශීය වෛද්‍ය අංශය විසිනි. ඒ අනුව පෙර වෛද්‍ය සභාව ලබා දී තිබූ තීන්දු සහ අමාත්‍යාංශයේ තීරණයන්ට අනුව වෛද්‍ය සභාවේ සේවාවන් පවත්වා ගෙනයාමට ක්‍රියා කළ වසරක් ලෙස මෙම වසර සැලකිය යුතුවේ. එබැවින් වෛද්‍යවරුන් ලියාපදිංචි කිරීම ඇතුලු වෛද්‍ය සභාවේ අනුමැතිය ලබා ගතයුතු සියලුම කර්තව්‍යයන් මුළුමනින්ම පාහේ ව්‍යර්ථ වූ වසරක් ලෙස මෙම වසර හැඳින්විය හැකිය.

1. රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය හා කළමනාකරණය

1.1 රජයේ හෝමියෝපති සායනවල කාර්ය සාධනය

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලැබූ රජයේ හෝමියෝපති සායන 7 ට අමතරව දිස්ත්‍රික්ක 5 ක රජයේ හෝමියෝපති නව සායන 5ක් මෙම වසරේ ජනවාරි මාසයේ දී ආරම්භ කරන ලදී. හම්බන්තොට, පුත්තලම, මඩකලපුව, කළුතර සහ නුවරඑළිය මෙසේ හෝමියෝපති නව සායන අරම්භ කළ දිස්ත්‍රික්ක 5 වේ.

අනුව 2019 වසර පුරා රජයේ හෝමියෝපති සායන 12න් ප්‍රතිකාර ලබාගත් රෝගීන් සංඛ්‍යාව පහත සඳහන් පරිදි විය.

සායනය	පැමිණි රෝගීන් සංඛ්‍යාව
මොණරාගල	5,073
දෙහිවල	18,829
මාතලේ	10,350
තෝලංගමුව	19,888
කුරුණෑගල	12,795
පරකඩුව	13,688
පාලමුණෙ	7,770
කොත්මලේ	11,202
අම්බලන්තොට	5,419
ඉංගිරිය	2,935
මඩකලපුව	2,752
පුත්තලම	7,169
එකතුව	**117,870**

1.2 රජයේ හෝමියෝපති සායන කළමනාකරණය

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය මහජන සෞඛ්‍ය සේවාවක් ලෙස ප්‍රවර්ධනය කිරීමේ අරමුණින් හෝමියෝපති වෛද්‍ය සභාව අරම්භ කර පවත්වා ගෙනයනු ලබන රජයේ හෝමියෝපති සායන 12, වසර තුළ දී රෝගීන් වැඩිම ප්‍රමාණයක් හෝමියෝපති ප්‍රතිකාර ලබා ගන්නා, රජයේ ආයතන පද්ධතිය බවට මේ වනවිට පත්ව ඇත. 2019 වසර තුළ දී මෙම සායන වලින් හෝමියෝපති ප්‍රතිකාර ලබාගන්නා රෝගීන් සංඛ්‍යාව එක් ලක්ෂ දස දහස ඉක්මවීය.
මෙම වසරේදී ද ඉහත සායන කළමනාකරණයට හා පහසුකම් ලබා දීමට වෛද්‍ය සභාව ක්‍රියා කරනු ලැබීය. ඒ යටතේ කාර්ය මණ්ඩල නඩත්තුව, ගොඩනැගිලි පහසුකම් ලබා දීම හා ප්‍රවර්ධනය කිරීම, සායන වල ජලය, විදුලිය හා සනීපාරක්ෂක සේවාවන් පවත්වාගෙන යාම මෙයට අයත් වේ.

02. හෝමියෝපති ජංගම සායන හා සම්මන්ත්‍රණ පැවැත්වීම.

2.1 වැලිසර හෝමියෝපති රෝහල සමඟ සංවිධානය කරනු ලබන ජංගම සායන හා සම්මන්ත්‍රණ

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය ජනතාව අතර ප්‍රචලිත කිරීමේ අරමුණින් වැලිසර හෝමියෝපති රෝහල සමඟ ජංගම සායන හා සම්මන්ත්‍රණ වාර්ෂිකව සංවිධානය කරනු ලබයි. මෙම වසරේ ජංගම සායන පැවැත්වීමට ප්‍රමාණවත් ඖෂධ හෝමියෝපති රෝහල තුළ නොපැවතීම නිසා වසරේ මුල් මාස වලට පමණක් මේවා පැවැත්වීම සීමා කිරීමට සිදුවිය. මේ යටතේ පැවැත්වූ සම්මන්ත්‍රණ සංඛ්‍යාව 5කි. ජංගම සායන 5ක් ද පවත්වන ලදී.

අනු අංකය	දිනය	සම්මන්ත්‍රණය	රෝගීන්ගේ සහභාගීත්වය		
			ගැහැණු	පිරිමි	එකතුව
01.	2019.02.15	දේශීය වෛද්‍ය අංශය	35	19	54
02.	2019.04.20	පෙරියමුල්ල	69	23	92
03.	2019.05.25	කලුතර දකුණු විශ්ව ළමා සමිතිය	65	16	81
04.	2019.06.13	රඹුක්කන ප්‍රාදේශීය ලේකම් කාර්යාලය	53	25	78
05.	2019.06.23	වැලිතර, බලපිටිය	53	35	88
එකතුව					**393**

2.2 රජයේ හෝමියෝපති සායන මඟින් සංවිධානය කෙරෙන සම්මන්ත්‍රණ හා ජංගම සායන

හෝමියෝපති වෛද්‍ය සභාව මඟින් මෙහෙයවනු ලබන රජයේ හෝමියෝපති සායන මඟින් හෝමියෝපති ප්‍රතිකාර සේවාව පවත්වාගෙන යාම හා ප්‍රවර්ධනය කිරීම උදෙසා පමණක් නොව මෙම වෛද්‍ය ක්‍රමය මහජනයා අතර ප්‍රචලිත කිරීම සඳහා ද වැඩසටහන් පවත්වනු ලබයි. මෙයින් ප්‍රධානම වැඩසටහන වන්නේ දැනුවත් කිරීමේ සම්මන්ත්‍රණ හා ජංගම සායන පැවැත්වීමය.

මෙම සායන වලින් හෝමියෝපති ප්‍රතිකාර ගෙන රෝග සුවපත් වූ අය ඔවුන්ගේ ප්‍රදේශයේ ප්‍රජා සංවිධාන සමඟ සංවිධානය කෙරෙන මෙම වැඩසටහන් සඳහා රජයේ අමතර මුදලක් වැය කිරීමක් සිදු නොකෙරෙන අතර හෝමියෝපති ප්‍රතිකාරයන්හි සාර්ථකත්වය මඟින් ප්‍රජාව මෙම වෛද්‍ය ක්‍රමය ප්‍රවර්ධනය කිරීම සඳහා ඇතිවන උනන්දුව හා කැපවීම මත සංවිධානය කෙරෙන වැඩසටහනක් ලෙස මෙම වැඩසටහන හැඳින්විය හැකිය.

2.2.1 දෙහිවල රජයේ හෝමියෝපති සායනය මඟින් පැවැත්වූ සම්මන්ත්‍රණ හා ජංගම සායන

අ. දෙහිවල-ගල්කිස්ස නගර සභාව මඟින් සංවිධානය කරනු ලබන "පුරපති සැරිසර" වැඩසටහන යටතේ පැවති සම්මන්ත්‍රණ හා ජංගම සායන

අනු අංකය	දිනය	ස්ථානය	රෝගීන් ගණන
01.	2019.01.12	රත්මලාන ජයසුමනාරාම විහාරය	40
02.	2019.06.29	දෙහිවල ක්‍රිස්තුදේව විද්‍යාලය	60
03.	2019.09.21	රත්මලාන ගෝල්ඩන් ලයන් සුපර් ක්ලබ් පරිශ්‍රය	68
		එකතුව	**168**

ආ. මෙම සායනය විසින් පවත්වනු ලබන "සුව යාත්‍රා" සමාජ මෙහෙවර යටතේ පැවැත් වූ සම්මන්ත්‍රණ හා ජංගම සායන

අනු අංකය	දිනය	ස්ථානය	රෝගීන් ගණන
01.	2019.03.20	දිගන රිසෝට් පරිශ්‍රය	204
02.	2019.12.11	කුරුදුගහ, ඇල්පිටිය ජයබිම විවේක සේනාසන පරිශ්‍රය	180
		එකතුව	**384**

2.2.2 කුරුවිට - පරකඩුව රජයේ හෝමියෝපති සායනය මඟින් පැවැත්වූ සම්මන්ත්‍රණ හා ජංගම සායන

අනු අංකය	දිනය	ස්ථානය	රෝගීන් ගණන
01.	2019.01.18	නාකන්දල ගංගාරාම විහාර පරිශ්‍රය	40
02.	2019.02.22	කුරුවිට වතුයාය ශ්‍රී අභිනවාරාම විහාර පරිශ්‍රය	46
03.	2019.04.22	පන්නිපිටිය ධර්මපාල විද්‍යාලය	58
		එකතුව	**144**

2.2.3 මොණරාගල රජයේ හෝමියෝපති සායනය මඟින් පැවැත්වූ සම්මන්ත්‍රණ හා ජංගම සායන

අනු අංකය	දිනය	ස්ථානය	රෝගීන් ගණන
01.	2019.07.20	පස්සර යූරිවත්ත	162
02.	2019.06.08	ලුණුගල සුඩාවත්ත, වත්ත	120
		එකතුව	**282**

2.2.4 ඉංගිරිය රජයේ හෝමියෝපති සායනය මඟින් පැවැත්වූ සම්මන්ත්‍රණ හා ජංගම සායන

අනු අංකය	දිනය	ස්ථානය හෝමියෝපති වෛද්‍ය සභාව	රෝගීන් ගණන
01.	2019.10.02	නැගෙනහිර - ඉංගිරිය, අක්කර 20 වසම	76
		එකතුව	**76**

03. හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මාධ්‍ය වැඩසටහන්

හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ මාධ්‍ය වැඩසටහන් ගණනාවක් දෙහිවල රජයේ හෝමියෝපති සායනයේ කාර්යභාර වෛද්‍ය නිලධාරිනි අනුෂා හේමකුමාර මිය විසින් පවත්වන ලදී. ඒ අනුව පැවැත්වූ මාධ්‍ය වැඩසටහන් පහත පරිදි වේ.

පුවත්පත් ලිපි

01. ඉසිවර පුවත්පත

- 2019 ජනවාරි - යටිපතුල් රිදුමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 පෙබරවාරි - ගැස්ට්‍රයිටීස් වලට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 මාර්තු - ගිලිහුණු සමබරතාවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 අප්‍රේල් - සයටිකා පාද වේදනාවට හෝමියෝපති
- 2019 මැයි - කොන්දේ වේදනාවට හෝමියෝපති
- 2019 ජුනි - කොන්දේ වේදනාවට හෝමියෝපති
- 2019 ජුලි - උරහිස් වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 අගෝස්තු - අස්ථි දිරායාම වලකාලන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 සැප්තැම්බර් - අර්ශස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ඔක්තෝම්බර් - රුමටොයිඩ් ආතරයිටිස් වලට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 නොවැම්බර් - නහර ගැට ගැසීමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019දෙසැම්බර් - ඩෙංගු රෝගයට හෝමියෝපති ප්‍රතිකාර

02. තරුණි පුවතපත

- 2019 ජනවාරි - බෙල්ල කැක්කුමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 පෙබරවාරි - නහර ගැට ගැසීමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 මාර්තු - කොන්දේ වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 මැයි - යටිපතුල් රිදුමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ජුනි - පීඩාකාරී ඇඳුම රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ජුලි - ඩෙංගු රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 අගෝස්තු - සයටිකා පාද වේදනාවට හෝමියෝපති
- 2019 ඔක්තෝම්බර් - පාකින්සන් රෝගීන්ට පුනර්ජීවය හෝමියෝපති
- 2019 නොවැම්බර් - අර්ශස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019දෙසැම්බර් - ගල් තැලුම් රෝගයට සුවය ගෙනෙන හෝමියෝපති

03. ලක්බිම

- 2019 පෙබරවාරි - පාකින්සන් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ජුනි - සයටිකා රෝගයට හෝමියෝපති ප්‍රතිකාර

04. හිරු රැස
Online Magazine

- 2019 අගෝස්තු - කොන්දේ වේදනාවට හෝමියෝපති
- 2019 සැප්තැම්බර් - ගැස්ට්‍රයිට්‍රිස් වලට හොඳම විසඳුම හෝමියෝපති

05. රැජිණ

- 2019 ඔක්තෝම්බර් 20 - පාකින්සන් රෝගයට හෝමියෝපති ප්‍රතිකාර

06. දිවයින (සඳුදා)

- 2019.01.07 - සයටිකා රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.03.11 - අස්ථි දිරායාම වලකාලන හෝමියෝපති ප්‍රතිකාර
- 2019.04.02 - ගැස්ට්‍රයිටීස් වලට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.05.27 - යටිපතුල් රිදුමට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.06.10 - ගිලිහීගිය සමබරතාව යලි ගොඩනඟන හෝමියෝපති
- 2019.07.08 - සෙලියුලයිටිස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.08.26 - උරහිස් වේදනාවට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.09.23 - බෙල්ල කැක්කුම සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019.10.21 - අර්ශස් සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019.12.02 - දියවැඩියාව සුවයට හෝමියෝපති ප්‍රතිකාර

07. දිවයින (ඉරිදා)

- 2019.05.05 - අපස්මාරයට හෝමියෝපති ප්‍රතිකාර

08. වෛද්‍යවරයා මාසික සඟරාව

- 2019 ජනවාරි - සෙලියුලයිටිස් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 පෙබරවාරි - සයටිකා සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 මාර්තු - ඉබේ මූත්‍රා පිටවන්නේ ඇයි?
- 2019 අප්‍රේල් - පාකින්සන් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 මැයි - අත් පා ඇදය නැති කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ජූනි - ගැස්ට්‍රයිටිස් සුව කරන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ජූලි - හිසරදයට, ඉරුවාරදයට නිසැක සුවය හෝමියෝපති
- 2019 අගෝස්තු - කොන්දේ අමාරුවට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 සැප්තැම්බර් - පිඩාකාරී ඇඳුම රෝගයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019 ඔක්තෝම්බර් - අස්ථි දිරායාම වලකාලන හෝමියෝපති ප්‍රතිකාර
- 2019 නොවැම්බර් - දියවැඩියාව සුවයට හෝමියෝපති ප්‍රතිකාර
- 2019දෙසැම්බර් - රුමටොයිඩ් ආතරයිටිස් වලට හෝමියෝපති

ගුවන්විදුලි වැඩසටහන්

V FM

- 2019 පෙබරවාරි 6 - හෝමියෝපති වෛද්‍ය ක්‍රමය හැඳින්වීම

රූපවාහනී වැඩසටහන්

01. සියත ටීවී - පියුම්විල සජීවී විකාශනය.

2019.01.11 - පාද ඇදය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2019.02.08 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2019.03.08 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2019.04.05 - බඩේ දැවිල්ල, ගැස්ට්‍රයිටිස් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2019.05.10 - කුරුලෑ පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

2019.06.14 - කොන්දේ වේදනාව පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

02. ජාතික රූපවාහිනිය - නුගසෙවන සජීවී විකාශනය

- 2019.06.27 - පාකින්සන් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2019.07.25 - සයටිකා රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2019.08.22 - අර්ශස් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2019.09.26 - රුමටොයිඩ් ආතරයිටිස් රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2019.10.24 - අංශභාග රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව
- 2019.11.28 - හර්ණියා රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

03. සිරස ටීවී - ජීවිතයට ඉඩදෙන්න වැඩසටහන

- 2019.06.21 - කොන්දේ අමාරුව රෝගය පිළිබඳ හෝමියෝපති සාකච්ඡාව

<u>විශේෂ අවස්ථා</u>

හෝමියෝපති වෛද්‍යවරියක වන වෛද්‍ය අනුෂා හේම කුමාර මහත්මිය 2019. 09.10 වන දින බණ්ඩාරනායක සම්මන්ත්‍රණ ශාලාවේ දී පැවති 2019 ශ්‍රමාභිමාණී සම්මාන උලෙළෙහි දී " දිරිය කාන්තාභිමාණී" සම්මානයෙන් පිදුම් ලැබීය.

04. රජයේ හෝමියෝපති නව සායන ආරම්භ කිරීම.

2019 වසරේ දි දිස්ත්‍රික්ක 5ක රජයේ හෝමියෝපති නව සායන 5ක් ආරම්භ කරන ලදී. මෙතෙක් පැවති රජයේ හෝමියෝපති සායන 7ට නව සායන 5ක් එක්කළ මෙම වසර ශ්‍රී ලංකාවේ හෝමියෝපති සංවර්ධන ඉතිහාසයේ කැපිපෙනෙන වසරක් ලෙස මේ අනුව සටහන් වී ඇත.

අනු අංකය	දිස්ත්‍රික්කය	ස්ථානය
01.	පුත්තලම	පුත්තලම MOH ගොඩනැගිල්ල
02.	හම්බන්තොට	අම්බලන්තොට ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය
03.	නුවරඑලිය	කොත්මලේ නව නගරය ප්‍රාදේශීය ලේකම් කාර්යාල පරිශ්‍රය
04.	මඩකලපුව	මුනායි විදිය, පුලියන්තිව්
05.	කලුතර	විදෙස් මිතුදම, මහ ඉංගිරිය.

05. වෛද්‍ය නිලධාරීන් හා කම්කරුවන් නව සායන සඳහා අනුයුක්ත කිරීම.

නව සායන සඳහා සම්මුඛ පරීක්ෂණ මඟින් තෝරාගෙන සිටි හෝමියෝපති උපාධිධාරීන් සහ ඩිප්ලෝමාධාරී වෛද්‍යවරුන් 6 දෙනෙකු වෛද්‍ය නිලධාරී තනතුර සඳහා මෙම වසරේ දී බඳවා ගන්නා ලදී. එමෙන්ම තෝරාගනු ලැබ සිටි පස්දෙනෙකු සඳහා නව සායන 5හි කම්කරු තනතුරු ලබා දෙනු ලැබිය.

මෙම පත්වීම ලබා දීමත් සමඟ හෝමියෝපති වෛද්‍ය සහා කාර්ය මණ්ඩලයේ තනතුරු ලාභීන්ගේ සංඛ්‍යාව 38 දක්වා වර්ධනය විය. එහෙත් කොත්මලේ සායනයේ කාර්ය භාර වෛද්‍ය නිලධාරී ලෙස සේවය කළ වෛද්‍යවරයා ඇමරිකාවේ පුරවැසිභාවය ලැබීම නිසා තනතුරින් ඉල්ලා අස්වීමත් සමඟ තනතුරු ලාභීන්ගේ සංඛ්‍යාව 37ක් බවට පත්විය.

06.ඖෂධ ආනයනය සඳහා බලපත්‍ර ලබා දීම.

හෝමියෝපති ඖෂධ ආනයනය සඳහා පහත නම් සඳහන් වෛද්‍යවරුන් සහ ආයතනය වෙත ඩොලර් 68344.395ක් සහ **යුරෝ** 1435.53 වටිනා ආනයන බලපත්‍ර 17ක් සඳහා නිර්දේශ ලබා දී ඇත.

I.	Dr. W.D.N Leetus	-		**€ 1035.53**
II.	Dr. W.D.N Leetus	-	**$ 7014.22**	
III.	Dr. W.D.N Leetus	-	**$ 8166.18**	
IV.	Dr. S.P Pathirage	-	**$ 2923.60**	
V.	Dr. W.D.N Leetus	-	**$ 1399.72**	
VI.	Dr. W.D.N Leetus	-	**$ 1481.75**	
VII.	Dr. Anusha Priyangani	-		**€ 400.00**
VIII.	Dr. W.D.N Leetus	-	**$ 3153.50**	
IX.	Dr. N.H.S Manel	-	**$ 1175.08**	
X.	Dr. W.D.N Leetus	-	**$ 5461.60**	
XI.	Dr. W.D.N Leetus	-	**$ 5966.555**	
XII.	Dr. W.D.N Leetus	-	**$ 2900.00**	
XIII.	Dr. W.D.N Leetus	-	**$ 1621.60**	
XIV.	Dr. W.D.N Leetus	-	**$ 1599.76**	
XV.	Dr. W.D.N Leetus	-	**$ 2019.05**	
XVI.	Dr. W.D.N Leetus	-	**$ 2441.87**	
XVII.	State Pharmaceuticals Corporation of Sri Lanka	-	**$ 21019.91**	
	Total	**=**	**$ 68344.395**	**€ 1435.53**

10. වාර්ෂික ගිණුම් වාර්තා

හෝමියෝපති වෛද්‍ය සභාව

2019.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අවසාන ගිණුම්

අන්තර්ගතය

- ගිණුම්කරණ ප්‍රතිපත්ති
- 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 8 දක්වා)
- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 8 දක්වා)
- 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශය හා පාදක සටහන් (1 සිට 6 දක්වා)
- 2019 දෙසැම්බර් 31 දිනට ස්කන්ධය වෙනස් වීමේ වාර්තාව
- 2019 දෙසැම්බර් 31 දිනට ශේෂ පිරික්සුම

ගිණුම්කරණ ප්‍රතිපත්ති

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති (2009) අංක 1ට අනුවය. එසේම එහි ‘‘ස්වභාවය මත වියදම් වර්ගීකරණය විදහාපෑම’’ යන පරිදි ඉදිරිපත් කර ඇත. හෝමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්තන හා මූල ධන වියදම් සඳහා රජයෙන් ලැබුණ ප්‍රතිපාදනයන් සභාවට ලද ප්‍රදානයක් ලෙසත් එසේම එම ප්‍රදානයන්ගෙන් දරණ ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

ක්ෂය සඳහා වෙන් කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගන වේ.

2019 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12% ක්ෂය අනුපාතයට වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිති අංක 7 (24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත.

2018 දෙසැම්බර් 31 දක්වා වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත.

2019 වර්ෂය සඳහා වත්කම් මිලදී ගැනීමක් සිදු වී නොමැත. වත්කම් වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද අදාළ සම්පූර්ණ වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ.

පාරිතෝෂික සඳහා වෙන් කිරීම

1983 අංක 12 දරණ පාරිතෝෂික ගෙවීමේ පනත අනුව වර්ෂ පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් පාරිතෝෂික ගෙවීම සඳහා සුදුසුකම් ලබන බැවින් පනතේ සඳහන් පරිදි වසර පහකට වැඩි සේවා කාලයක් ඇති නිලධාරීන් සඳහා පමණක් පාරිතෝෂික සඳහා වෙන්කරනු ලැබ ඇත. 2019 වර්ෂය සඳහා මෙම පනත ප්‍රකාරව අලුතින් සුදුසුකම් ලැබූ නිලධාරීන් නොමැත.

හොම්යෝපති වෛද්‍ය සභාව

2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ව ප්‍රකාශය

	සටහන්	2019 රු	2018 රු
වත්කම්			
ජංගම වත්කම්			
මුදල් හා මුදල් සමාන දෑ	1	2,511,862	2,404,226
ජංගම නොවන වත්කම්			
පිරියත හා උපකරණ	2	1,871,388	2,126,578
ගොඩනැගිලි පුනුරුත්ථාපන		5,407,281	5,407,281
වෙනත් උපකරණ		1,450	1,450
		7,280,119	**7,535,309**
මුළු වත්කම්		**9,791,981**	**9,939,535**
බැරකම්			
ජංගම බැරකම්			
ගෙවිය යුතු දෑ	3	**1,135,643**	**1,141,508**
ජංගම නොවන බැරකම්			
මුළු බැරකම්		1,135,643	1,141,508
ශුද්ධ වත්කම්		8,656,338	8,798,027
		9,791,981	**9,939,535**
ශුද්ධ වත්කම් / ස්කන්ධය			
ප්‍රාග්ධනය		2,562,144	2,562,144
රජයේ ප්‍රාග්ධන ප්‍රතිපාදන(සංචිත)		7,502,334	7,502,334
සමුච්චිත ඌනතා / අතිරික්තතා	4	(1,377,724)	(1,236,035)
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම		(30,416)	(30,416)
		8,656,338	**8,798,027**

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොම්යෝපති වෛද්‍ය සභාව විසින් දරණ බව සහතික කරමු

.....	.....	.....	.....
ලේඛකාධිකාරී	සභාපති	කමිටු සමාජික	සකස් කළේ
හොම්යෝපති	හොම්යෝපති	හොම්යෝපති	කේ.එස්.පියසිරි
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	විශ්‍රාමික ප්‍රධාන
			ගණකාධිකාරී
			දේශීය වෛද්‍ය
			අමාත්‍යාංශය

විස්තරය	2019 රු	2018 රු
සටහන 01		
මුදල් හා මුදලට සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,874, 489	1,787,553
ලංකා බැංකුව	441, 473	420,773
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	195,900
	2,511,862	**2,404,226**
සටහන 02		
පිරියත හා උපකරණ		
පිරියත හා උපකරණ(ගත්මිල)	3,800,150	3,800,150
අඩුකලා		
සමුච්චිත ක්ෂය	(1,928,762)	(1,673,572)
ශුද්ධ අගය	**1,871,388**	**2,126,578**
සටහන 03		
ගෙවිය යුතු දෑ		
ගෙවිය යුතු විගණන ගාස්තු	179,010	163,861
ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු	42,000	42,000
ගෙවිය යුතු දුරකතන ගාස්තු	3,997	5,742
ගෙවිය යුතු විදුලිය	5,386	4, 408
ගෙවිය යුතු ජලය	20,292	9,526
ගෙවිය යුතු වැටුප් හා දීමනා	8,500	62, 291
ගෙවිය යුතු අර්ථසාධක අරමුදල්	-	3,590
ගෙවිය යුතු සේවා නියුක්ති භාර අරමුදල්	-	898
ගෙවිය යුතු පාරිතෝෂික	840,650	840,650
ගෙවිය යුතු ගමන් වියදම්	28,691	6,697
ගෙවිය යුතු සායන වියදම්	5,117	1,845
ගෙවිය යුතු වරිපනම්	2,000	-
	1,135,643	**1,141,508**
සටහන 04		
සමුච්චිත උණතා / අතිරික්තතා 2019.01.01ක්ෂය	(1,236,035)	(1, 236,035)
එකතු කළා 2019 වර්ෂයේ කාර්ය සාධනයේ උණතා / අතිරික්තතා	(141,689)	-
	(1, 377,724)	**(1,236,035)**

සටහන 05

ගිණුම් ඉදිරිපත් කිරීම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරන ප්‍රමිති (2009) අංක 1 ට අනුවය

සටහන 06

ක්ෂය සඳහා වෙන්කිරීම

සෑම ස්ථාවර වත්කමක්ම ක්ෂය කර ඇත්තතේ හීනවන ශේෂ ක්‍රමය පදනම් කරගන වේ. 2019 දෙසැම්බර් 31 දක්වා සෑම වත්කමක්ම ක්ෂය කර ඇත්තේ 12 % ක්ෂය අනුපාතය වේ.

ශ්‍රී ලංකා රාජ්‍ය ගිණුම් කරන ප්‍රමිති අංක 7 (24) පරිදි වත්කම්හි පිරිවැය ගිණුම්ගත කර ඇත.

2018 දෙසැම්බර් 31 දක්වා වත්කම් වර්ෂයේ කුමන දිනයක මිලදී ගත්තද එය සම්පූර්න වර්ෂය සඳහාම ක්ෂය කරනු ලැබ ඇත.

2019 වර්ෂය සඳහා වත්කම් මිලදී ගැනීමක් සිදු වී නොමැත.

වත්කම්, වර්ෂයේ කුමන දිනයක ඉවත් කලද අදාල සම්පූර්න වර්ෂය සඳහාම ක්ෂය කරනු නොලැබේ

සටහන 07

පාරිතෝෂිත සඳහා වෙන්කිරීම

2019 වර්ෂය සඳහා 1983 අංක 12 දරණ පාරිතෝෂිත ගෙවීම් පනත ප්‍රකාරව අලුතින් සුදුසුකම් ලැබූ නිලධාරීන් නොමැත.

සටහන් 08

2019 වර්ෂයේදී සභාවට එරෙහිව නඩු 3ක් පවරා ඇති අතර ඒවා පහත පරිදි වේ.

I. CA/87/13 අංක දරණ අභියාචනාදිකරන නඩු තීන්දුව මගින් නව හොමියෝපති පනත ගෙන ඒමට පෙර ක්‍රියාත්මක වූ හොමියෝපති අතුරු පාලන කමිටුව පත්කිකරීම හා එකී තීරන අවලංගු කිරීමට එරෙහිව ගරු ශ්‍රේෂ්ඨාධිකරණයේ ගොනු කර ඇති අභියාචනය විභාගයට ගෙන ඇත.

II. වෙද්‍ය සභා කාර්යාලයේ තාවකාලික පදනමින් සේවය කළ කම්කරුවකුගේ සේවය අවසන් කිරීමට එරෙහිව නැවත රැකියාව ඉල්ලා වත්තල කම්කරු උසාවියේ පවරා ඇති 30/52/2010 අංක දරණ නඩුව හා මෙම පැමිණිලිකරු විසින්ම සිය රැකියාව අහිමි කිරීමට එරෙහිව වන්දි මුදලක් ඉල්ලා මීගමුව දිස්ත්‍රික් අධිකරණයේ පවරා ඇති 13953M අංක දරණ නඩුව විභාගවෙමින් පවතී.

III. වෛද්‍ය වරුන්ගේ නාම ලේඛනය ගැසට් පත්‍රයේ පලකිරීමට එරෙහිව හොමියෝපති වෛද්‍ය සභාව හා එහි ලේඛාධිකාරවරයාව වග උත්තර කරුවන් කරමින් මීගමුව දිසා අධිකරණයේ පවරා ඇති 14318 අංක දරණ නඩුවද විභාග වෙමින් පවතී.

හොමියෝපති වෛද්‍ය සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
මූල්‍ය කාර්ය සාධන ප්‍රකාශය

	සටහන්	2019 රු	2018 රු
අයභාරය			
රජයේ පුණරාවර්තන ප්‍රතිපාදන		21,273,216	15,632,730
වෙනත් අයභාර	1	20,700	47,850
බැංකු පොලි		91,505	87,001
මුළු අයභාරය		**21,385,421**	**15,767,581**
වියදම			
වැටුප් වේතන හා සේවක ප්‍රතිලාභ	2	19,682,529	13,468,291
සැපයුම් හා පාරිභෝගික ද්‍රව්‍ය	3	746,148	71,356
ක්ෂය හා ක්‍රම ක්ෂය		255,190	201,976
වෙනත් වියදම්	4	838,674	2,332,399
මූල්‍ය පිරිවැය(බැංකු ගාස්තු)		4,569	5,132
මුළු වියදම		**21,527,110**	**16,079,154**
කාලච්ඡේදය සඳහා ඌනතාවය/අතිරික්තය		(141,689)	(311,573)

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොමියෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු

.....	.....	.....	.....
ලේඛකාධිකාරී	සභාපති	කමිටු සමාජික	සකස් කළේ
හොමියෝපති	හොමියෝපති	හොමියෝපති	කේ.එස්.පියසිරි
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	විශ්‍රාමික ප්‍රධාන
			ගණකාධිකාරී
			දේශීය වෛද්‍ය
			අමාත්‍යාංශය

විස්තරය	2019 රු	2018 රු
සටහන 01		
වෙනත් අයහාර		
වාර්ෂික ගාස්තු	10,450	26,350
විවිධ ලැබීම්	10,250	21,500
	20,700	**47,850**
සටහන 02		
වැටුප් චේතන හා සේවක ප්‍රතිලාභ		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	17,129,036	11,749,368
සේවක අර්ථසාධක අරමුදල්	2,042,796	1,375,138
සේවා නියුක්ති භාර අරමුදල්	510,697	343,785
	19,682,529	**13,468,291**
සටහන 03		
සැපයුම් හා පරිභෝජන ද්‍රව්‍ය		
ලිපි ද්‍රව්‍ය වියදම්	8,007	17,708
සංග්‍රහ වියදම්	22,775	53,648
ඖෂධ බහාලුම් මිලට ගැනිම	532,000	-
ඖෂධ බහාලුම කවර මිලට ගැනිම	183,366	-
	746,148	**71,356**
සටහන 04		
වෙනත් වියදම්		
ගණකාධිකාරි ගාස්තු	42,000	42,000
විගණන ගාස්තු	200,733	20,000
දුරකථන ගාස්තු	62,509	83,744
වෛද්‍ය සායන වියදම්	44,935	13,126
විදුලි ගාස්තු	97,010	68,806
ජල ගාස්තු	80,080	44,958
ගමන්වියදම් හා නවාතැන් ගාස්තු	79,617	49,972
ඉන්ධන වියදම්	-	11,000
තැපැල් වියදම්	15,185	20,785
මුද්‍රණ වියදම්	23,718	120,526
විවිධ වියදම්	4,825	26,522
භාෂා පරිවර්තන ගාස්තු	60,715	30,260
සභාපති දීමනා	-	725,000
වෛද්‍ය සහා රැස්වීම් දීමනා	-	306,000
පුවත්පත් දැන්වීම් ගාස්තු	-	308,200
පාරිතෝෂික වියදම්	-	343,036
ප්‍රවාහන වියදම්		1,780

වරිපනම	2,000	1,884
කුලී වියදම	-	36,000
නීති ගාස්තු	113,500	78,800
අලුත්වැඩියා වියදම	11847	-
	838,674	**2,332,399**

සටහන් අංක 05

ගිණුම් ඉදිරිපත් කිරිම

ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් කරණ ප්‍රමිති (2009) අංක 1 ට අනුවය .එසේම එහි "ස්වභාවය මත වියදම් වර්ගිකරණය විදහාපෑම" යන පරිදි ඉදිරිපත් කර ඇත.

සටහන් අංක 06

2019 වර්ෂය සදහා විගණන ගාස්තු වෙන්කර ඇත .

සටහන් අංක 07

පාරිතෝෂික සදහා වෙන්කිරිම.

2019 වර්ෂය සදහා , 1983 අංක 12 දරණ පරිතෝෂික ගෙවීම් පනත ප්‍රකාරව අලුතින් සුදුසුකම් ලැබූ නිලධාරින් නොමැත.

සටහන් අංක 08

හොමියෝපති වෛද්‍ය සභාවේ පුනරාවර්තන හා මූලධන වියදම් සදහා රජයෙන් ලැබුනු ප්‍රතිපාදනයන් සභාවට ලැබුනු ප්‍රදානයන් ලෙසත් එසේම එම ප්‍රදානයන්ගෙන් දරණු ලැබූ වියදම් සභාවේ වියදම් ලෙසත් සලකා අවසන් ගිණුම් පිළියෙල කර ඇත.

හොම්යෝපති වෛද්‍ය සභාව
2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය

	සටහන්	2019 රු	2018 රු
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
ලැබීම්			
රජයෙන් ලද පුනරාවර්ථන ප්‍රදානය		21,273,216	15,632,730
බැංකු පොලි		91,505	87,001
වෙනත් ලැබීම්	1	20,700	47,850
		21,385,421	**15,767,581**
ගෙවීම්			
සේවක පිරිවැය	2	19,740,807	13,509,715
බැංකු පොලි		4,569	5,132
වෙනත් ගෙවීම්	3	1,532,409	2,123,015
		21,277,785	**15,637,862**
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහයන්		**107,636**	**129,719**
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ මුදල් ප්‍රවාහයන්			
රජයෙන් ලද ප්‍රාග්ධන ප්‍රදානය		-	**1,824,409**
ගොඩනැගිලි පුනුරුත්ථාපන සඳහා		-	1,179,775
දේපල පිරියත හා උපකරණ		-	644,634
ආයෝජන ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය			
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම	4	**107,636**	**129,719**
කාලාවිච්ඡේදය ආරම්භයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ	5	2,404,226	2,274,507
කාලවිච්ඡේදය අවසානයේදී වූ මුදල් හා මුදල් සමාන දෑ	6	2,511,862	2,404,226

මෙම මූල්‍ය ප්‍රකාශනය සකස් කිරීමේ සහ ඉදිරිපත් කිරීමේ වගකීම හොම්යෝපති වෛද්‍ය සභාව විසින් දරන බව සහතික කරමු.

.....	.....	.....	.....
ලේඛකාධිකාරී	සභාපති	කමිටු සමාජික	සකස් කළේ
හොම්යෝපති	හොම්යෝපති	හොම්යෝපති	කේ.එස්.පියසිරි
වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	වෛද්‍ය සභාව	විශ්‍රාමික ප්‍රධාන
			ගණකාධිකාරී
			දේශීය වෛද්‍ය
			අමාත්‍යාංශය

විස්තරය	2019 රු	2018 රු
සටහන 01 වෙනත් ලැබීම්		
වාර්ෂික ගාස්තුව	10,450	26,350
විවිධ ආදායම්	10,250	21,500
	20,700	**47,850**
සටහන 02 සේවක පිරිවැය		
කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා	17,182,827	11,785,936
සේවක අර්ථසාධක අරමුදල්	2,046,384	1,379,023
සේවා නියුක්ති භාර අරමුදල්	511,596	344,756
	19,740,807	**13,509,715**
සටහන 03 අනෙකුත් ගෙවීම්		
විගණන ගාස්තු	185,584	-
දුරකථන ගාස්තු	64,254	83,644
විවිධ වියදම්	4,825	26,522
විදුලි ගාස්තු	96,031	68,695
ජල වියදම්	69,315	50,507
ගමන් වියදම්	57,623	43,275
ඉන්ධන වියදම්	-	11,000
තැපැල් ගාස්තු	15,185	20,785
මුද්‍රණ ගාස්තු	23,718	120,526
ලිපි ද්‍රව්‍ය	8,007	17,708
සංග්‍රහ වියදම්	22,776	53,648
පරිවර්තන ගාස්තු	60,715	30,260
සභාපති දීමනා	-	800,000
වෛද්‍ය සහා නිලධාරි රැස්වීම් දීමනා	-	306,000
දැන්වීම් ගාස්තු	-	308,200
කාර්යාල සුළු අළුත්වැඩියා	11,847	-
වරිපනම්	-	1,884
සායන වියදම්	41,663	11,281
කුලී	-	36,000
නීති ගාස්තු	113,500	131,300
ප්‍රවාහන	-	1780
ඖෂධ බහාලුම් මිලට ගැනීමේ වියදම්	532,000	-
ඖෂධ බහාලුම් කවර මිලට ගැනීම්	183,366	-
ගණකාධිකාරි ගාස්තු	42,000	
	1,532,409	**2,123,015**
සටහන 04		
මුදල් හා මුදල් හා සමාන දෑ හි ශුද්ධ වැඩිවීම්	2,511,862	2,404,226
වර්ෂ අවසාන මුදල් ශේෂය	2,404,226	2,274,507
වර්ෂ ආරම්භක මුදල් ශේෂය	**107,636**	**129,719**

සටහන 05		
කාලච්ඡේදය ආරම්භයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,787,553	1,702,684
ලංකා බැංකුව	420,773	375,923
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	195,900
	2,404,226	**2,274,507**
සටහන 06		
කාලච්ඡේදය අවසානයේ වූ මුදල් හා මුදල් හා සමාන දෑ		
කොමර්ෂල් බැංකුව	1,874,489	1,787,553
ලංකා බැංකුව	441,473	420,773
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	195,900
	2,511,862	2,404,226
	107,636	**129,719**
සමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත / (ඌණතාවය), මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය සමඟ සැසඳීම		
සමාන්‍ය ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ අතිරික්ත /(ඌණතාවය)	(141,689)	(311,573)
මුදල් නොවන වෙනස්වීම්		
ක්ෂය වීම්	255,190	201,976
ගෙවිය යුතු වැය වැඩි වීම්/අඩු වීම්	(5,865)	297,192
පෙර වර්ෂයේ ගැලපුම් ගිනුමේ වාර්ෂික වෙනස්වීම් වැඩි වීම් /අඩු වීම්	-	(57,876)
මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් වූ ශුද්ධ මුදල් ප්‍රවාහය	**107,636**	**129,719**

Date.....

හොම්යෝපති වෛද්‍ය සභාව

ස්කන්ධය වෙනස්වීම (සංචිත) 2019	රු
2019.01.01 දිනට ප්‍රාග්ධන ගිණුමේ ශේෂය	2,562,144
2019.01.01 දිනට ප්‍රාග්ධන ප්‍රතිපාධන ගිණුමේ ශේෂය	7,502,334
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම	(30,416)
සමුච්චිත ඌණතාවය/අතිරික්තය	(1,377,724)
2019.12.31 දිනට ශේෂය	**8,656,338**

2019 දෙසැම්බර් 31 දිනට ශේෂපිරික්සුම

	හර	බැර
බැංකුව (කොමර්ෂල්)	1,874,489	
වෙනත් උපකරණ	1,450	
පිරියත උපකරණ	3,800,150	
ලංකා බැංකුව	441,473	
ලංකා බැංකුව (රාජගිරිය)	195,900	
ක්ෂය වෙන් කිරීම		1,928,762
ගෙවිය යුතු විගණන ගාස්තු		179,010
ගෙවිය යුතු ගණකාධිකාරි ගාස්තු		42,000
ගෙවිය යුතු දුරකථන ගාස්තු		3,997
ගෙවිය යුතු විදුලි ගාස්තු		5,386
ගෙවිය යුතු ජල ගාස්තු		20,292
ගෙවිය යුතු වැටුප් හා දීමනා		8,500
ගෙවිය යුතු පාරිතෝෂික දීමනා		840,650
ප්‍රාග්ධනය		2,562,144
රජයේ මූලධන ප්‍රතිපාදන (සංචිත)		7,502,334
සමුච්චිත ඌණතා අතිරික්තතා ගිණුම	1,236,035	
පෙර වර්ෂයේ ගැලපුම් ගිණුම	30,416	
පුනරාවර්ථන වියදම් සඳහා රජයේ ප්‍රදානයන්		21,273,216
වැටුප් හා දීමනා	17,129,036	
ගෙවිය යුතු ගමන් වියදම්		28,691
අර්ථසාධක අරමුදල්	2,042,796	
සේවා නියුක්ති භාර අරමුදල්	510,697	
දුරකථන වියදම්	62,509	
විදුලි වියදම්	97,010	
ජල වියදම්	80,080	
වරිපනම් ගාස්තු	2,000	
සායන වියදම්	44,935	
ලිපි ද්‍රව්‍ය වියදම්	8,007	
ගමන් වියදම් හා නවාතැන් ගාස්තු	79,617	
සංග්‍රහ වියදම්	22,775	
විවිධ වියදම්	4,825	
තැපැල් වියදම්	15,185	
මුද්‍රණ ගාස්තු	23,718	
නීති ගාස්තු	113,500	
පරිවර්තන ගාස්තු	60,715	
ගෙවිය යුතු සායනික වියදම්		5,117
බැංකු පොලී		91,505

ලියාපදිංචි ගාස්තු		10,450
විවිධ ආදායම්		10,250
වාර්ෂික ක්ෂය	255,190	
විගණන ගාස්තු	200,733	
ගණකාධිකාරි ගාස්තු	42,000	
බැංකු ගාස්තු හා බදු	4,569	
අලුත් වැඩියා වියදම්	11,847	
ගෙවිය යුතු වරිපනම්		2,000
ඖෂධ බහාලුම් වියදම්	532,000	
ඖෂධ බහාලුම් කවර වියදම්	183,366	
ගොඩනැගිලි පුණුරුත්ථාපන හා වැඩි දියුණු කිරීම	5,407,281	
	34,514,304	**34,514,304**

11. විගණන වාර්තාව

2019 වර්ෂය යනු හෝමියෝපති වෛද්‍ය සභාව ක්‍රියාත්මක නොවූ වර්ෂයක් සහ ඒ නිසාම වෛද්‍ය සභාවේ මෙහෙයුමට යටත්ව ක්‍රියාත්මක නොවූ වසරක් විය. මේ නිසා වෛද්‍ය සභාවේ කටයුතු අමාත්‍යාංශයේ මෙහෙයවීම යටතේ සිදු කෙරුණු අතර ඒවා ක්‍රියාත්මක කරනු ලැබුවේ වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරීවරයා මඟිනි. 2019 වසර වෙනුවෙන් සැකසූ මුල්‍ය තත්ත්ව ප්‍රකාශනය, මුල්‍ය කාර්ය සාධන ප්‍රකාශනය, ඒකාබද්ධ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය, ශේෂ පිරික්සුම මේ සමඟ අමුණා ඇත.

2019 වසරේදී නව සායන 05ක් දිස්ත්‍රික්ක 5ක් තුළ ආරම්භ කර ඇති අතර මෙතෙක් දිස්ත්‍රික්ක 7ක පවත්වා ගෙන ගොස් තිබූ සායන 07 සායන 12 දක්වා වර්ධනය කර ගෙන ඇත. එමෙන්ම වෛද්‍ය වෘත්තිකයන් 07 දෙනෙක් රජයේ හෝමියෝපති වෛද්‍ය නිලධාරීන් ලෙස සේවයට බඳවා ගැනීමට ලැබීම මෙන්ම නව කම්කරු තනතුරු 5ක් සඳහා සේවකයින් බඳවා ගැනීමට ලැබීම සුවිශේෂී අවස්ථාවකි.

2020 සැප්තැම්බර් මස 2016 අංක 10 දරණ හෝමියෝපති පනතට අනුකූලව නව වෛද්‍ය සභාව ආරම්භ කරනු ලැබූ අතර ආයතනය පවත්වා ගෙන යාම සඳහා අවශ්‍ය පරිපාලනමය සහ මුල්‍යමය ක්‍රියාවන් සිදු කිරීම මෙන්ම වඩාත් විශිෂ්ට හෝමියෝපති සේවාවක් ජනතාවට ලබාදීම වෛද්‍ය සභාවේ ප්‍රධාන අරමුණු වේ.

වෛද්‍ය ඩී. එම්. අෂාන් තිලංක
සභාපති
හෝමියෝපති වෛද්‍ය සභාව

ජාතික විගණන කාර්යාලය
தேசிய கணக்காய்வு அலுவலகம்
NATIONAL AUDIT OFFICE

මගේ අංකය / எனது இல. / My No. } එච්එස්එම්/බී/එච්එම්සී/1/19/04

ඔබේ අංකය / உமது இல. / Your No. }

දිනය / திகதி / Date } 2021 පෙබරවාරි 19 දින

සභාපති,
හෝමියෝපති වෛද්‍ය සභාව

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වගන්තිය ප්‍රකාර විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 මතය

හෝමියෝපති වෛද්‍ය සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

සභාවේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී. ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ වගකීම්, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම් යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව | இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. | No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.

+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සභාව අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සභාව ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සභාවේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සභාවේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.
මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදී. කවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මහඟරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම,

චේතනාන්විත මහහැරීම් හෝ අභ්‍යන්තර පාලනයන් මහහැරීම් වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සභාවේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සභාවේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව් කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදී.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිළි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සභාව පවත්වාගෙන ගොස් තිබුණි.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාව ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඇ)(iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුළ, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ යම් සාමාජිකයෙකුට සභාව සම්බන්ධවී යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අනුයාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් ලිඛිත නීතියකට හෝ සභාවේ භාරකාර මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීති රීති හා විධානවලට යොමුව	විස්තරය
(අ) 2016 අංක 10 දරන හෝමියෝපති පනතේ 28 (6) උප වගන්තිය	හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයින් ලියාපදිංචි කිරීම සඳහා වෛද්‍ය සභාව විසින් පවත්වාගෙන යනු ලබන ලේඛනය, ලියාපදිංචිය අලුත් කිරීමේ ගාස්තු ගෙවූ වෛද්‍යවරුන් හා නොගෙවූ වෛද්‍යවරුන් වෙන් වෙන්ව හඳුනා ගැනීමට හා හිඟහිටි ගාස්තුව හඳුනා ගැනීමට හැකි පරිදි යාවත්කාලීනව පවත්වා නොතිබුණි.
(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය	
(i) මුදල් රෙගුලාසි 754	සෑම මුදල් වර්ෂයකම අවසානයේ බඩු ලේඛන පොත තුළනය කළ යුතු වුවද, 2019 දෙසැම්බර් 31 දිනට පොදු ද්‍රව්‍ය ලේඛනය හා ශල්‍ය ද්‍රව්‍ය ලේඛනය තුළනය කර නොතිබුණි.

(ii) මුදල් රෙගුලාසි 756	ආයතනයේ බඩු පිළිබඳ වාර්ෂික සමීක්ෂණයක් සිදු කිරීම සඳහා සමීක්ෂණ මණ්ඩලයක් පත් කළ යුතු වුවත් 2018 සහ 2019 වර්ෂ සඳහා සමීක්ෂණ මණ්ඩල පත්කර භාණ්ඩ සමීක්ෂණයක් සිදුකර නොතිබුණි.
(ඇ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 16.1 වගන්තිය	2014 හා 2015 වර්ෂවලදී බදවාගෙන තිබුණු ඖෂධ සංයෝජකවරු 7 ක් හා වෛද්‍ය නිලධාරීන් 7 ක් සඳහා කාර්යක්ෂමතා කඩඉම් විභාග 2020 අගෝස්තු 31 දින වන විටත් පවත්වා නොතිබුණි. මේ හේතුවෙන් මෙම නිලධාරීන් සේවයෙහි ස්ථීර කළ නොහැකිව තිබුණු අතර ඔවුන්ගේ පරිවාස කාලය දීර්ඝ කරද නොතිබුණි.
(ඇ) 2014 අගෝස්තු 13 දිනැති අංක පීඊඩී 25 (2) දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව, රාජ්‍ය බැංකුවක පවත්වාගෙන යන ගිණුමක මුදල් තැන්පත් කළ යුතු වුවත්, 2009 වර්ෂයේදී අයකර තිබුණු පාඨමාලා ගාස්තු පෞද්ගලික බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක තැන්පත්කර තිබුණි. 2019 දෙසැම්බර් 31 දිනට එම ගිණුමේ ශේෂය රු.1,874,489 ක් විය.

- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.
- 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12(ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සභාවේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතකර නොමැති බව.

3. වෙනත් විගණන නිරීක්ෂණ

(අ) හෝමියෝපති වෛද්‍ය වෘත්තියෙහි යෙදීම ප්‍රවර්ධනය කිරීම, අභිවර්ධනය කිරීම හා නියාමනය කිරීම, හෝමියෝපති වෛද්‍ය ක්‍රමය පිළිබඳ පර්යේෂණ කිරීම හා ප්‍රවර්ධනය කිරීම, ඖෂධ වර්ග සහ වෙනත් පිළියෙල කිරීම් නිෂ්පාදනය, විකිණීම හා බෙදාහැරීම නියාමනය කිරීම හා පාලනය කිරීම යන ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීම සඳහා ක්‍රියාකාරී සැලැස්මක් සමාලෝචිත වර්ෂය වෙනුවෙන් පිළියෙල කර නොතිබුණි.

(ආ) සභාව විසින් පවත්වාගෙන යන සායන 7 ක් සඳහා සමාලෝචිත වර්ෂය තුළ දෛනිකව සහභාගී වූ රෝගීන්ගේ සාමාන්‍යය 8 ත් 29 ත් අතර වුවද, දෛනික රෝගී සහභාගීත්වය වැඩිකර ගැනීම කෙරෙහි සභාවේ අවධානය යොමුකර නොතිබුණි.

(ඇ) හෝමියෝපති පනතේ 30(1) වගන්තිය ප්‍රකාරව, හෝමියෝපති වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීම සඳහා විභාගයක් පැවැත්වීමට 2018 වර්ෂයේදී අයදුම්පත් කැඳවා තිබුණු අතර අයදුම්පත් 189 ක් ලැබී තිබුණි. එසේ වුවද විභාගය පැවැත්වීම සඳහා නීති හා රෙගුලාසි සම්පාදනය කිරීම අවසන්කර නොතිබීම හා සභාවේ කටයුතු සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් විභාග වෙමින් පැවතීම හේතුවෙන් 2020 අගෝස්තු 31 දින වන විටත් විභාගය පැවැත්වීමට හා වෛද්‍ය වෘත්තිකයන් ලියාපදිංචි කිරීමට නොහැකි වී තිබුණි.

(ඈ) හෝමියෝපති වෛද්‍ය විද්‍යාලයක් ආරම්භ කිරීම සඳහා 2008 වර්ෂයේදී ගොඩනැගිල්ලක් ඉදිකර 2009 වර්ෂයේදී ඒ සඳහා ලී බඩු හා වෙනත් අවශ්‍ය උපකරණ සපයාගෙන තිබුණි. එහි අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට අදාළ නීතිමය රාමුව පිළියෙල කිරීම සඳහා අවශ්‍ය පියවර ගෙන නොතිබීම හේතුවෙන් 2020 අගෝස්තු 31 දින වන විටත් අධ්‍යයන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණි. ඒ අනුව මිලදීගෙන තිබුණු පිරිවැය රු.1,199,254 ක් වූ ස්ථාවර වත්කම් හා ඊට අදාළ ගොඩනැගිල්ල වර්ෂ 10 කට අධික කාලයක් තිස්සේ නිෂ්කාර්යව පැවතුණි.

(ඉ) 2019 දෙසැම්බර් 31 දිනට සභාවේ අනුමත කාර්ය මණ්ඩලය 48 ක් වුවද තථ්‍ය කාර්ය මණ්ඩලය 36 ක් විය. සභාව සඳහා අත්‍යවශ්‍ය තනතුරුවන වෛද්‍ය නිලධාරීන් දෙදෙනෙකු හා ඖෂධ සංයෝජකවරු 07 දෙනෙකුගේ පුරප්පාඩු 2020 අගෝස්තු 31 දින වන විටත් පිරවීමට කටයුතුකර නොතිබුණි.

ඩබ්ලිව්.ජී.සී.වික්‍රමරත්න
විගණකාධිපති

සුභාශිංසන

★ ★ ★ ★

ගරු දේශීය වෙදකම් ප්‍රවර්ධන, ග්‍රාමීය හා ආයුර්වේද රෝහල් සංවර්ධන සහ

ප්‍රජා සෞඛ්‍ය රාජ්‍ය අමාත්‍ය සිසිර ජයකොඩි මැතිතුමා

ලේකම් සහ අතිරේක ලේකම්වරියන්

හෝමියෝපති වෛද්‍ය සභාවේ සභාපති ඇතුළු

සාමාජිකයන්/ සාමාජිකාවන්

නීතිපති දෙපාර්තමේන්තුව

විගණකාධිපති දෙපාර්තමේන්තුව

හෝමියෝපති වෛද්‍ය සභාවේ ලේඛකාධිකාරී

හා

කාර්ය මණ්ඩලය